# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2007 අංක 52 දරන මහනුවර අස්ගිරියේ පලිපාන ශ්‍රී චන්ද්‍රානන්ද ජාත්‍යන්තර බෞද්ධ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත

---

[**සහතිකය සටහන් කළේ 2007 ඔක්තෝබර් මස 24 වන දින**]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---


2007 ඔක්තෝබර් මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ **:** රු. 6.00 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

# 2007 අංක 52 දරන මහනුවර අස්ගිරියේ පලිපාන ශ්‍රී චන්ද්‍රානන්ද ජාත්‍යන්තර බෞද්ධ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2007 ඔක්තෝබර් මස 24 වන දින]

එල්. ඩී.— ඕ. 13/2004

මහනුවර අස්ගිරියේ පලිපාන ශ්‍රී චන්ද්‍රානන්ද ජාත්‍යන්තර බෞද්ධ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

"පලිපාන ශ්‍රී චන්ද්‍රානන්ද ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය" හා "පලිපාන ශ්‍රී චන්ද්‍රානන්ද බෞද්ධ පර්යේෂණ ආයතනය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ආයතන දෙකක් ඒ ආයතනයන්හි පරමාර්ථ සහ ඒ ආයතනවලට සම්බන්ධ සියලු කාරණා ඒ ඒ ආයතනවල සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව සාර්ථක ලෙස ඉෂ්ට කිරීම සඳහා ශ්‍රී ලංකාවේ මහනුවර පිහිටුවාගෙන තිබුණු හෙයින් ද : පූර්විකාව.

එකී ආයතන පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා මෙතෙක් කල් ඒ ආයතනයන් විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් "මහනුවර අස්ගිරියේ පලිපාන ශ්‍රී චන්ද්‍රානන්ද ජාත්‍යන්තර බෞද්ධ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය" යනුවෙන් එක් ආයතනයක් වශයෙන් සංස්ථාගත කරනු ලැබීමට දැන් ඉල්ලුම් කර ඇති හෙයින් ද, ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2007 අංක 52 දරන මහනුවර අස්ගිරියේ පලිපාන ශ්‍රී චන්ද්‍රානන්ද ජාත්‍යන්තර බෞද්ධ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ආරම්භ වීමේ දින සිට සහ ඉන්පසුව (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) මහනුවර අස්ගිරියේ පලිපාන ශ්‍රී චන්ද්‍රානන්ද ජාත්‍යන්තර බෞද්ධ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ දැනට සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් "මහනුවර අස්ගිරියේ පලිපාන ශ්‍රී චන්ද්‍රානන්ද ජාත්‍යන්තර බෞද්ධ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද එකී නාමයෙන් නඩු පවරනු ලැබිය හැකි අතර පොදු මුද්‍රාවක් තබා ගැනීමේද එය පාවිච්චි කිරීමේද එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. මහනුවර අස්ගිරියේ පලිපාන ශ්‍රී චන්ද්‍රානන්ද ජාත්‍යන්තර බෞද්ධ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම.

2-PL 001849-2,800 (2007/03)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3**. සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) මහනුවර අස්ගිරි මහා විහාරයේ පිහිටි පුස්තකාලය සහ දෙමහල් ධර්ම මන්දිරය හා එය පිහිටි ඉඩම හා ඊට සම්බන්ධ චංචල හා නිශ්චල දේපල ආරක්ෂා කිරීම, නඩත්තු කිරීම හා සංවර්ධනය කිරීම ;

(ආ) පෙර දී, පලිපාන ශ්‍රී චන්ද්‍රානන්ද ජාත්‍යන්තර බෞද්ධ පර්යේෂණ මධස්ථානයට අයත්ව තිබූ සහ වර්තමානයේ, මහනුවර අස්ගිරිය පලිපාන ශ්‍රී චන්ද්‍රානන්ද ජාත්‍යන්තර බෞද්ධ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය වෙත පවරා තිබෙන සියලුම නිශ්චල සහ චංචල දේපළ ආරක්ෂා කිරීම, සංවර්ධනය කිරීම හා පරිපාලනය කිරීම;

(ඇ) බෞද්ධ දර්ශනය ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි ව්‍යාප්ත කිරීම සඳහා බෞද්ධ භික්ෂූන් වහන්සේලා සහ බෞද්ධයින් පුහුණු කිරීම ; සහ

(ඈ) බෞද්ධ දර්ශනය හා ඊට අනුබද්ධ විෂයයන් හැදෑරීමට හා පර්යේෂණ පැවැත්වීම සඳහා බෞද්ධයින් දිරිමත් කිරීම සහ ඔවුනට ආධාර දීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4**. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව බැංකු ගිණුම් විවෘත කිරීමේ, වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද එහි අරමුදල් ආයෝජනය කිරීමේ හා වියදම් කිරීමේද, ප්‍රදානයන් හා පරිත්‍යාගයන් භාර ගැනීමේ හා එකතු කිරීමේද සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීමේ කාර්යය සඳහා අවශ්‍ය නිලධරයන් හා සේවකයන් සේවයේ නියුක්ත කරවීමේ, සේවයේ යෙදවීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර ආකාරයක හෝ සියලු ක්‍රියා කිරීමේ, ඉටු කිරීමේ හා ක්‍රියාවේ යෙදවීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5**. (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණ මණ්ඩලයක් විසින් මේ පනතේ විධිවිධානවලට සහ 6 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවලට අනුකූලව කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

කළමනාකරණ මණ්ඩලය, මහනුවර අස්ගිරියේ පලිපාන ශ්‍රී චන්ද්‍රානන්ද ජාත්‍යන්තර බෞද්ධ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ ආයතනාධිපතීන් වහන්සේ, (මෙහි මින් මතු "ආයතනාධිපතීන් වහන්සේ" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ, ලේඛකාධිකාරී සහ භාණ්ඩාගාරික යන අයගෙන් සහ සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන අනෙකුත් කාරක සභිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

(2) කළමනාකරණ මණ්ඩලයේ සෑම රැස්වීමකම මූලසුන ආයතනාධිපතීන්වහන්සේ විසින් දැරිය යුතුය. කළමනාකරණ මණ්ඩලයේ රැස්වීමකට ආයතනාධිපතීන් වහන්සේ පැමිණ නොසිටි අවස්ථාවකදී අධ්‍යක්ෂවරයා ඒ රැස්වීමේ මූලසුන දැරිය යුතු ය.

(3) කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම් සම්බන්ධයෙන් සහ එම රැස්වීම්වල දී සාකච්ඡාවට භාජනය කරනු ලැබිය යුතු කාරණා සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, මේ පනතේ විධිවිධානවලට සහ ඒවා යටතේ සාදන ලද රීතිවලට යටත්ව කරනු ලැබිය යුතු ය.

(4) කළමනාකරණ මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කාර්ය පරිපාටියක් එහි සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීම හෝ සාමාජිකයන් තෝරා පත් කිරීමේදී හෝ නම් කිරීමේදී සිදු වී ඇති යම් දෝෂයක් කරණ කොට ගෙනම පමණක් අවලංගු නොවන්නේ ය.

(5) සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ මණ්ඩලය මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේදී මධ්‍යස්ථානයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත වන්නේ ය.

සංස්ථාවේ රීති.

**6**. (1) සාමාජිකයන් ඇතුළත් කරගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම, කළමනාකාර මණ්ඩලය සහ සංස්ථාවේ නොයෙකුත් නිලධාරීන්ගේ හා සේවකයන්ගේ කටයුතු කර ගෙන යාම, සංස්ථාවේ සහ කළමනාකාර මණ්ඩලයේ රැස්වීම්වල දී කටයුතු කිරීමෙහි ලා අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම හා එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, මහා සභා රැස්වීමක දී හා ඒ රැස්වීමට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් සංස්ථාව විසින් කලින් කළ සෑදීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) සංස්ථාවේ යම් රීතියක් එහි මහාසභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් හැර, වෙනස් කිරීම, එවාට යමක් එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම කරනු නොලැබිය යුතු ය.

(3) සංස්ථාවේ සාමාජිකයෝ සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

7. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය. ත්‍යාග, රික්ථවරණය, පරිත්‍යාග, පැවරුම්, ග්‍රාහක මුදල්, දායක මුදල්, හෝ ගාස්තු කළමනාකාර මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනාවක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කරගෙන යාමේ දී සංස්ථාව විසින් දරන ලද යම් වියදම් පියවීමට අවශ්‍ය මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ මුදල් සහ දේපළ කවර ස්ථානයකින් උපලබ්ධි වුව ද, මෙහි දක්වා ඇති පරිදි, සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම උදෙසා පමණක් යොදවනු ලැබිය යුතු අතර, ලාභාංශයක් ප්‍රසාද දීමනාවක් හෝ අන් කවර හෝ ලාභයක් වශයෙන් සංස්ථාවේ මුදල් සහ දේපළවලින් කිසිම කොටසක් සංස්ථාවේ සාමාජිකයන්ට කෙළින්ම හෝ අන්‍යාකාරයකින් ගෙවීම හෝ පැවරීම කරනු නොලැබිය යුතු ය.

ගිණුම් හා විගණනය.

8. (1) සංස්ථාවට ලැබුණු සහ සංස්ථාව විසින් වියදම් කරනු ලැබූ සියලුම මුදල් පිළිබඳව නිසි අයුරින් ගිණුම් තැබීමට සංස්ථාව විසින් සැලැස්විය යුතු ය.

(2) සංස්ථාව විසින් පත් කරන ලද විගණකවරයකු හෝ විගණකවරයන් විසින් යටත් පිරිසෙයින් වර්ෂයකට එක් වරක් හෝ සංස්ථාවේ ගිණුම් පරීක්ෂා කොට, විගණනය කළ යුතු අතර, ආදායම් සහ වියදම් ගිණුමෙහි සහ ශේෂ පත්‍රයෙහි නිරවද්‍යතාව ඔවුන් විසින් සහතික කළ යුතු ය.

ආයතනය විසින් සහ ආයතනයට ගෙවිය යුතු මුදල්.

9. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයෙහි ආයතනයෙහි පැවති සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලැබූ සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට ආයතනයට ගෙවිය යුතු ග්‍රාහක මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

**10**. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක්, ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතුවන යම් චංචල හෝ නිශ්චල දේපළක් ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට බලය හා හැකියාව ඇති අතර, එවැනි සියලු දේපළ සංස්ථාවේ තත්කාලීනව බලපවත්නා, රීතිවලට යටත්ව, මේ පනතේ කාර්යය සඳහා ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ, පූර්ණ බලය ඇතිව සංස්ථාව විසින් දැරිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**11**. සංස්ථාවේ මුද්‍රාව කළමනාකාර මණ්ඩලය භාරයේ තිබිය යුතු ය. කළමනාකාර මණ්ඩලයේ සාමාජිකයකු සහ ලේකම්වරයා හෝ මණ්ඩලය විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර වූ හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. තව ද, අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**12**. සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර, බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් දේපළක් හෝ යම් ආදායමක් ස්වකීය සාමාජිකයන් අතර, බෙදීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

**13**. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**14**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.